# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## බුද්ධ චරිතය

## 06 වන පාඩම; යොවුන් විය, ගිහිගෙය කළකිරීම

[[ 2024/2025 ]] **04 වන ප්‍රශ්නය**

I –

II –

III සුද්ධෝදන රජතුමා සිද්ධාර්ථ කුමරු ගැන තබා තිබූ බලාපොරොත්තුව ලියා දක්වා, එය ඉටු කර ගැනීමට අනුගමනය කළ ක්‍රියා මාර්ග කෙටියෙන් පහදන්න.

IV උයන් කෙළි නිමවා පැමිණෙන සිද්ධාර්ථ කුමාරයා දැක කිසාගෝතමී සිදුකළ නිවීමේ සුවය ගැන වූ ප්‍රකාශය ගෙනහැර දක්වා එහි අදහස කෙටියෙන් පහදන්න.

**05 වන ප්‍රශ්නය**

I සිදුහත් බෝසතුන් බුදුවීමට පෙර මර්ධනය කළ අකුසල විතර්ක අතුරින් දෙකක් සහ වර්ධනය කළ කුසල විතර්ක අතුරින් දෙකක් නම් කරන්න.

II සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් අර්හත් මාර්ගඥානයත් සමග සාක්ෂාත් කළ බුද්ධඥාණ හතරක් දක්වන්න.

**07 වන ප්‍රශ්නය**

I –

II –

III –

IV “ චතුරංග සමන්නාගත වීයෛන් යුක්තව බුද්ධත්වය ලැබූ බුදුන් වහන්සේ සර්වඥතා ඥාණයෙන්ද යුක්ත වූහ.” ඉහත ප්‍රකාශයෙහි ‘වීයී හා සර්වඥතා ඥාණය’ ඇසුරින් ලෝකයාට සපයන ආදර්ශ ගෙනහැර දක්වන්න.

[[ 2019/2020 ]] **04 වන ප්‍රශ්නය**

I සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ වෙසක් මස පුර තුදුස්වක දින රාත්‍රියෙහි දුටු සිහින පහ අතරින් හතරක් ලියන්න.

II ඉහත සඳහන් කළ සිහින හතරෙහි අර්ථ වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්න.

III සිදුහත් බෝසතුන් වැඩූ ‘චතුරංග සමන්නාගත් වීර්ය’ කෙටියෙන් පහදන්න.

IV සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ සම්බුද්ධත්වය සාක්ෂාත් කර ගැනීමෙහිලා සිත මෙහයවූ ආකාරය විස්තර කරන්න.

## 05 වන ප්‍රශ්නය

I සම්බුද්ධත්වයට පෙර බෝසතාණන් වහන්සේ පළවා හළ දසමාර සේනාව අතරින් හතරක් නම් කරන්න.

## [[ 2018/2019 ]] 04 වන ප්‍රශ්නය

I –

II –

III සතර පෙරනිමිති වලින් පෙන්නුම් කෙරෙන ජීවිත යථාර්තය පැහැදිලි කරන්න.

IV සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ සත්‍යාවබෝධය සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග කෙටියෙන් සාකච්ඡා කරන්න.

## [[ 2017/2018 ]] 05 වන ප්‍රශ්නය

I –

II –

III –

IV සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ කුසල ගවේශීව ගුරුවරුන් ඇසුරු කළ ආකාරය කෙටියෙන් පහදන්න.

## 06 වන ප්‍රශ්නය

I සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ මහාභිනිෂ්ක්‍රමණය සඳහා පෙළඹවූ ආසන්න කරුණු හතර පෙන්වා දෙන්න.

II සිදුහත් කුමරුන්ගේ ප්‍රසන්න භාවය දුටු කිසා ගෝතමිය සතුට පළ කරමින් පැවසූ නිබ්බුත පද ලියා එහි අදහස ඉදිරිපත් කරන්න.

III මහාභිනිෂ්ක්‍රමණය යනු කුමක්දැයි දක්වා සිද්ධාර්ථ කුමරුගේ මහාභිනික්‍රමණය කෙටියෙන් සඳහන් කරන්න.

IV බෝසතාණන් වහන්සේ මහාභිනිෂ්ක්‍රමණයේ සිට සම්බුද්ධත්වය සාක්ෂාත් කිරීම තෙක් අනුගමණය කල ක්‍රියා මාර්ග කෙටියෙන් සඳහන් කරන්න.

## [[ 2016/2017 ]] 04 වන ප්‍රශ්නය

I –

II –

III “සතර පෙරනිමිති දැකීම තුළින් නිරූපණය වන්නේ බෝසතුන්ගේ සිතෙහි චතුරාර්ය සත්‍ය පිළිබඳ මූලික සංකල්පය ජනිත කළ අවශ්ථාවයි.” එය කෙටියෙන් පැහැදිලි කරන්න.

IV ජීවිතයේ යථාර්ථය සොයමින් ගුරුවරුන් සොයා ගිය බෝසතාණන් වහන්සේ ආළාරකාලාම-උද්දකරාමපුත්ත තාපසවරුන් වෙතින්ද යථාර්ථය හමු නොවේ යැයි සලකා ඔවුන්ද අතහැර කිං කුසල ගවේසීව තනිවම නිවන සෙවීමෙහි නිරත වුණි.මෙයින් ලෝකය වෙත සපයන ආදර්ශය පැහැදිලි කරන්න.

## 05 වන ප්‍රශ්නය

I බෝසත් චරිතය තුළින් පැවසෙන බුදුවීමට පෙර පළවා හැරි දස මරසෙන් අතරින් හතරක් නම් කරන්න.

II “බෝසතාණන් වහන්සේ සම්බුද්ධත්වය සාක්ෂාත් කිරීමේදී ත්‍රිවිද්‍යාව අතුරින් සිත ආශ්‍රවයන්ගෙන් මිදීමේ නුවණ (ආසවක්ඛය ඥාණය) නම් වූ තෙවැණි විද්‍යාව පහළ කළහ.” මීට අදාළ සතරාකාර ආශ්‍රවයන් ලියා දක්වන්න.

## [[ 2015/2016 ]] 05 වන ප්‍රශ්නය

I වෙසක් මස පුර තුදුස්වක දින බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පෙර දුටු සිහින අතුරින් හතරක් ලියා දක්වන්න.

II බෝසතාණන් වහන්සේ දුටු ඒ ඒ සිහින වලින් ප්‍රකාශිත අර්ථ පෙන්වා දෙන්න.

III බෝසතාණන් වහන්සේ තුළ පැවති චතුරංග සමන්නාගත වීර්ය කවරේදැයි දක්වා එයින් ජීවන අරමුණු ඉටුකර ගැනීමෙහිලා අපට ගත හැකි ආදර්ශ පෙන්වා දෙන්න.

IV බෝසතාණන් වහන්සේ බුද්ධත්වය සාක්ෂාත් කළ ආකාරය දක්වා අර්හත් මාර්ග ඥාණය සමග සාක්ෂාත්වූ විශිෂ්ඨ බුද්ධඥාණ කවරේදැයි පෙන්වා දෙන්න.

## [[ 2013/2014 ]] 04 වන ප්‍රශ්නය

I –

II –

III සතර පෙරනිමිති වලින් පෙන්නුම් කෙරෙන ජීවිත යථාර්ථය පැහැදිලි කරන්න.

IV බෝසතාණන් වහන්සේ සත්‍යාව බෝධය සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ග කෙටියෙන් සාකච්ඡා කරන්න.

## [[ 2012/2013 ]] 03 වන ප්‍රශ්නය

I දුක්ඛ ආර්ය සත්‍යයෙහි විස්තරවන ජරා,ව්‍යාධි,මරණ යන අවශ්ථා පිළිබඳව අත්දැකීම් බෝසතාණන්ට කුමාර කාලයේම අත්විඳින්නට ලැබුණු ආකාරය පැහැදිලි කරන්න.

II ‘නිබ්බාන’ ගවේෂණයට සිත යොමු කෙරුණු ගාථාවක් කිසාගෝතමිය පැවසුවාය. එම ගාථාව ලියන්න.

III සිදුහත් බෝසතාණන්ගේ මහාභිනිෂ්ක්‍රමණය පිළිබඳ පුවත කෙටියෙන් විස්තර කරන්න.

IV අත්ථ කිලමතානුයෝගයේ හිස් බව වටහා ගැනීමට පාදක වූ දුෂ්කර ක්‍රියාව බෝසතාණන් සිදු කළ ආකාරය විස්තර කරන්න.

## 04 වන ප්‍රශ්නය

I බෝසතාණන් වජ්‍රාසනයෙහි වැඩ හිඳිමින් ඉපදවූ චතුරංග සමන්නාගත වීර්ය කෙටියෙන් දක්වන්න.

II බෝසතුන්ගේ වජ්‍රාසනය උදුරා ගැනීමට වසවර්ති මාරයා දැරූ ප්‍රයත්නය කෙටියෙන් දක්වන්න.

## [[ 2011/2012 ]] 03 වන ප්‍රශ්නය

I බෝසතාණන් දුටු සතර පෙර නිමිති නම් කරන්න.

II නිබ්බුත පද දක්වා, එය ප්‍රකාශ කළේ කවුරුන් විසින්දැයි දක්වන්න.

III බෝසතාණන් සත්‍ය ගවේෂීව ගියේ කවර ගුරුවරුන් වෙතදැයි දක්වා, ඔවුන් වෙතින් උගත් දේ විස්තර කරන්න.

IV මහාභිනිෂ්ක්‍රමණයේ සිට පස්වග තවුසන් බෝසතුන් හැර යාම තෙක් සිදුවූ බෝසත් සිරිතට අදාළ සිදුවීම් පිළිවෙළින් විස්තර කරන්න.

## 04 වන ප්‍රශ්නය

I බෝසතාණන්ට කුසතණ පූජා කළේ කවුරුන් විසින්ද?

II බෝසතාණන්ට කිරිපිඬු පූජා කරන ලද්දේ කවර ගමක,කවර තැනැත්තියක් විසින්ද?

III බුද්ධත්වයට පෙර දුටු සිහින පස දක්වා, එම සිහින වලින් ප්‍රකාශිත අදහස දක්වන්න.

IV බුද්ධත්වයට පෙර පළවා හරින ලද දසමාර සේනාව නම් කර, බුද්ධත්වයට පත්වීමේ සිද්ධිය විස්තර කරන්න.

## [[ 2010/2011 ]] 04 වන ප්‍රශ්නය

I ත්‍රිවිද්‍යාව නම් කරන්න.

## [[ 2009/2010 ]] 04 වන ප්‍රශ්නය

I බුද්ධත්වයට පෙර බෝසතානන් දුටු සිහින පස නම් කර, එම සිහිනවල අර්ථ දක්වන්න.
II බෝසතාණන් විසින් පැරදවුණු දස මරසෙන් නම් කරන්න.
III බෝසතාණන් ඉපදවූ චර්හුරංග සමන්නාගත වීර්යය නම් කර මාර පරාජය පිළිබඳ සිදුවීම කෙටියෙන් විස්තර කරන්න.
IV මාර යුද්ධයෙන් ජයගත් බෝසතාණන් බුද්ධත්වය ලබාගත් ආකාරය පැහැදිලි කරන්න.

## [[ 2006/2007 ]] 04 වන ප්‍රශ්නය

I සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණයට තුඩු දුන් දුර හේතු හා ආසන්න හේතු සටහන් කරන්න.
II ‘කිං කුසල ගවේසී’ බෝසතාණන් වහන්සේ ඇසුරු කළ ආචාර්ය වරුන් නම් කර ඔවුන් වෙතින් බෝසතාණන් වහන්සේ ලත් දැනුම පැහැදිලි කරන්න.
III බෝසතාණන් වහන්සේ දුෂ්කර ව්‍රත සමාදානයෙන් විමුක්තිය කරා එළඹිය නොහැකි බව තහවුරු කර ගැනීමට දුෂ්කර ක්‍රියාවල යෙදුණු ආකාරය පැහැදිලි කරන්න.

## [[[ 2005 ]]] 05 වන ප්‍රශ්නය

I ‘කිං සච්ච ගවේසී’’ වූ බෝසතුන්ට මුණ ගැසුණු ආචාර්යවරුන් හා ඒ ඒ ආචාර්යවරුන්ගෙන් උන්වහන්සේ ලබා ගත් දැනුම කෙබඳු දැයි පැහැදිලි කරන්න.
II අත්ථකිලමතානුයෝගය පැවිද්දන් විසින් සේවනය නොකළ යුතු බවට උපදෙස් දීමට බෝසතාණන් ‘කිං සච්ච ගවේසී’ව ලත් අත්දැකීම් පාදක විය. එම අත්දැකීම් පිළිබඳව පරිපූර්ණ විස්තරයක් කරන්න.
III බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පළමුව දුටු සිහින පස දක්වා, ඒවායේ අර්ථ පැහැදිලි කරන්න.

## [[[ 2004 ]]] 04 වන ප්‍රශ්නය

I සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණයට බලපෑ ආසන්න හේතු පරීක්ෂා කරන්න.
II මහාභිනිෂ්ක්‍රමණය සාධාරණ අරමුණක් උදෙසා තැබූ එඩිතර පියවරක් බව සනාථ කරන්න.

[[[ 2003 ]]] 05 වන ප්‍රශ්නය

I අභිනිෂ්ක්‍රමණය කළ බෝසතුන් ආචාර්යවරුන් වෙතින් හදාළ කරුණු සැකෙවින් දක්වන්න.

II ආචාර්යවරුන්ගෙන් සමුගත් බෝසතුන් සත්‍ය ගවේෂණය උදෙසා දුෂ්කර ක්‍රියා කළ අයුරු සැකෙවින් දකවන්න.

[[[ 2002 ]]] 04 වන ප්‍රශ්නය

I සිදුහත් බෝසතුන් දුටු සිහින පහ ඒවායේ අර්ථ සමග සැකෙවින් දක්වන්න.

II බුද්ධත්වය ලබා ගැනීමේදී බෝසතුන් ත්‍රිවිද්‍යාව උපදවාගත් ආකාරය පැහැදිලි කරන්න.

[[[ 2001 ]]] 04 වන ප්‍රශ්නය

I නිබ්බුත පද සඳහන් ගාථාව නිවැරදිව ලියා එහි අර්ථය දක්වන්න.

II නිබ්බුත පද ඇසුරින් නිවුණු පුද්ගලයෙකුගේ ලක්ෂණ කෙසේ විය යුතු දැයි පෙන්වාදෙන්න.

[[[ 2000 ]]] 04 වන ප්‍රශ්නය

I දස මරසෙන් නම් කරන්න.

[[[ 1999 ]]] 04 වන ප්‍රශ්නය

I ආළාරකාලාම හා උද්දකරාමපුත්ත වෙතින් බෝසතුන් උපදවා ගත් සමාපත්ති කවරේද?

II බෝසතුන් සම්බෝධියට පත්වූ දිනයෙහි සිදුවීම් සමාලෝචනය කරන්න.

[[[ 1998 ]]] 04 වන ප්‍රශ්නය

I බෝධිසත්වයින් වහන්සේ අනුගමනය කල චතුරංග සමන්නාගත වීර්ය දක්වන්න.

II අභිනිෂ්ක්‍රමණයේ සිට බුද්ධත්වය දක්වා බෝසත් චරිතය ඇසුරෙන් බුද්ධත්වය අවබෝධ කර ගැනීම සඳහා අධිෂ්ඨාන පූර්වකව ක්‍රියා කළ අවස්ථා තුනක් පිළිබඳ විස්තර කරන්න.